# දොම්පෙ ප්‍රාදේශීය සභාව
## ගම්පහ දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 16 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට දොම්පෙ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ස්ථාවර වත්කම් ගිණුම් තැබීමට අදාලව ගිණුම් ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි. ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කළයුතු අවම වටිනාකමක් හා වත්කමේ ස්වභාවය හා ආයු කාලය අනුව එය ස්ථාවර වත්කමක් වශයෙන් හඳුනා ගැනීමකින් තොරව ඉතා සුළු වටිනාකමක් සහිත හා නැවත විකුණා මුදල් කරගත නොහැකි කෙටි ආයුකාලයක් සහිත අයිතම ස්ථාවර වත්කම් ගිණුමට ඇතුලත් කර තිබුණි.

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2017 වර්ෂයේ මිලදී ගත් රු.101,450 ක් වටිනා වානේ කබඩ් 03 ක්, පරිගණක ප්‍රින්ටර් 02 ක් හා පරිගණක උපාංග 06 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේ සභාව විසින් සාදවාගෙන තිබූ වටිනාකම රු.161,400 ක් වූ ජල ටැංකි රඳවන 06 ක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) දොම්පෙ උප කාර්යාලයේ සාරාංශ මුදල් පොත (ප්‍රා. ස. 5 ) අනුව අත ඉතිරි ශේෂය රු.21,877 වූ නමුත් එය ගිණුම් වල ශත 25 ක් ලෙස දක්වා තිබීමෙන් මුදල් ගිණුමෙහි ශේෂය රු.21,877 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ජෙනරේටරයක් මිලදී ගැනීම සඳහා අයවැය මගින් වෙන්කළ රු.3,200,000 ක් නිශ්චිත ණයහිමියෙකු හඳුනා නොගෙන ණයහිමි ගිණුමට ඇතුලත්කර වසරේ වියදමක් ලෙස ආදායම් වියදම් ගිණුමට කපා හැර තිබුණි.

(ඉ) කසල කරත්ත 15 ක, විල්බැරෝ 03 ක හා ලුමාලා බයිසිකලයක වටිනාකම වැඩිපුර පෙන්වීම නිසා මෝටර් රථ හා කරත්ත ගිණුම රු.146,482 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2017 දෙසැම්බර් 31 දිනට සමීක්ෂණ වාර්තාවල ඇති රු.11,414,068 ක් වටිනා වත්කම් 2017 වර්ෂයේ ගිණුම්වලට ගෙන නොතිබුණි.

(උ) ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ (පැරණි) තිබූ ගැල්වනයිස් බට 423 ක් ගිණුම්ගතකර නොතිබුණි.

1.3.3 <u>නොසැසඳුනු ගිණුම්</u>

මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ වරිපනම් රු.1,201,451 ක් වුවද උපලේඛනය අනුව එය රු.1,441,129 ක් වූයෙන් රු.239,678 ක වෙනසක් විය.

1.3.4 <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.</u> .

තහවුරු කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.142,388,155 ක් වූ ගිණුම් විෂයයන් 3 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 <u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | ------------------------------ | ---------- | -------------------- |
| | | රු. | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභාපනතේ 24 වගන්තිය | | සභා බල ප්‍රදේශයට අයත් සියළුම මංමාවත් වල සැලැස්මවල් පිළියෙල කර නාම ලේඛනයක් ගැසට් පත්‍රයක් මගින් පළකර සභා අයිතියට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. වර්ෂයෙන් වර්ෂයට නිම කරන ලද සියළුම මාර්ග එම ලේඛනයේ යාවත්කාලීන කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 193 | | එක් එක් ආදායම් විෂය යටතේ වන අතිරික්ත සහ/හෝ ඌණතාවයන් සහ එක් එක් වැයවිෂය යටතේ වන අතිරික්තයන් හෝ ඉතිරිවීම් පිළිබඳව කරුණු පැහැදිලි කරන ප්‍රකාශයක් සෑම වර්ෂයකම අවසානයේ පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | මුදල් රෙගුලාසි 371 | 150,556 | තත්කාර්ය අත්තිකාරම් කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවත් 1995 හා 2008 වර්ෂවල අවස්ථා 2 කදී නිකුත්කළ අත්තිකාරම් 2017 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |

1.3.6 **<u>ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>**

හිඟහිටි වරිපනම් බදු ලෙස රු. 163,313 ක මුදලක් සමුච්චිත අරමුදලට කපාහැර ඇති අතර ඒ සඳහා පළාත් පාලන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

02. **<u>මූල්‍ය සමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 47,974,046 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 54,646,630 ක් විය.

2.2 **<u>මූල්‍ය පාලනය</u>**

(අ) 202 - 1-001-8-4641360 දරන ජංගම ගිණුමේ වර්ෂය ආරම්භයේ සිටම අඛණ්ඩවම මිලියන 20 කට වැඩි අතිරික්ත මුදල් ශේෂයක් තිබුණ අතර මෙම මුදල් ආර්ථික ප්‍රතිලාභයක් ලැබෙන පරිදි සුදුසු ආයෝජනයක යෙදවීමට සලකා බලා නොතිබුණි.

(ආ) සභා අරමුදල් ප්‍රදේශයේ ජනතාවට උපරිම ප්‍රතිලාභ ලැබිය හැකි පරිදි සැලසුම් සහගතව වැය කිරීම සභාවේ අරමුණ වුවද, සභාව සතු මුදල් රුපියල් මිලියන147.17 ක් ස්ථාවර තැන්පතු 08 ක ආයෝජනය කර තිබුණි.

2.3 <u>ආදායම් පරිපාලනය</u>

2.3.1 **<u>ඇස්තමේන්තුගත</u>** <u>ආදායම් බිල් කළ ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 වර්ෂය | | | | 2016 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,826,661 | 6,385,571 | 6,232,235 | 1,201,451 | 5,957,289 | 6,052,053 | 7,035,074 | 1,607,024 |
| (ii) | කුලී | 10,752,705 | 10,752,704 | 10,819,858 | 61,350 | 7,880,395 | 10,729,109 | 8,031,793 | 128,504 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,129,000 | 1,029,000 | 919,000 | - | 1,278,188 | 1,638,912 | 1,291,009 | - |
| (iv) | වෙනත් ආදායම් | 167,301,715 | 167,301,715 | 167,038,988 | - | 197,254,488 | 156,795,699 | 266,538,576 | - |

2.3.2 **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

පෙර වර්ෂයේ තත්‍ය ආදායම රු.මිලියන 282.8 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ තත්‍ය ආදායම මිලියන 185 දක්වා රු.මිලියන 97.8 කින් කැපීපෙනෙන ලෙස අඩුවී තිබුණි. මෙම අඩුවීමට ප්‍රධාන හේතුව වී තිබුණේ වෙනත් ආදායම් නියෝජනය වන මුද්දර ආදායම හා කර්මාන්ත ලැබීම්වල අඩුවීමයි.

2.3.3 **වරිපනම් හා බදු**

(අ) 2017 දෙසැම්බර් 31 දිනට රු.1,441,129 ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ පහත පරිදි වසර 05 සිට වසර 10 දක්වා රු.248,602 ක් සහ වර්ෂ 10 ට වැඩි රු.366,551 ක් ඇතුලත් වූ අතර මෙම හිඟමුදල් අය කර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය ප්‍රකාරව පියවර ගෙන නොතිබුණි.

| උප කාර්යාලය | වර්ෂ 1 ට අඩු | වර්ෂ 1-3 දක්වා | වර්ෂ 3-5 දක්වා | වර්ෂ 5-10 දක්වා | වර්ෂ 10 ට වැඩි | මුළු හිඟ ආදායම | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | % |
| වැකේ | 106 ,564 | 49,747 | 69,816 | 48,627 | 9,949 | 284,703 | 19.7 |
| දොම්පෙ | 58,895 | 43,396 | 10,752 | 62,066 | 107,233 | 282,342 | 19.5 |
| කැරගල | 17,219 | 17,406 | 8,410 | 6,363 | 13,842 | 63,240 | 4.3 |
| පූගොඩ | 93,700 | 274,403 | 78,668 | 131,546 | 235,527 | 813,844 | 56.3 |
| | 276,378 | 384,952 | 167,646 | 248,602 | 366,551 | 1,444,129 | |

(ආ) අවසන් වරට වරිපනම් බදු තක්සේරුවක් සිදුකර තිබුණේ 2014 වර්ෂයේ වුවත් උපකාර්යාල හතරෙහිම 2017 වර්ෂයට වරිපනම් බදු අයකර තිබුණේ 2008 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන වීම නිසා වාර්ෂික වරිපනම් බදු ආදායම පහත මට්ටමක පැවතුනි.

(ඇ) දරිද්‍රතාවය මත පදනම් වූ වරිපනම් ඒකක වශයෙන් වැකේ උපකාර්යාලයේ 250 ක් හා දොම්පෙ 05 ක් වූ අතර දරිද්‍රතාවය මත සිදු කෙරෙන වරිපනම් බදු නිදහස් කිරීම් වලදී නිසි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ඈ) කිරිඳිවැල කළාප අධ්‍යාපන කාර්යාලයේ හිඟ වරිපනම් බදු වර්ෂ 05 ට අඩු රු. 63,588 ක් වර්ෂ 05 – 10 අතර රු. 67,847 ක් හා වර්ෂ 10 ට වැඩි රු. 12,633 ක් ලෙස එකතු වටිනාකම රු.144,068 ක් වූ අතර එම හිඟ අය කර ගැනීමට ක්‍රියා කර නොතිබුණි.

2.3.4 **බලපත්‍ර ගාස්තු**

(අ) වලංගු කාලය වර්ෂ 03 ක් වූ පරිසර ආරක්ෂණ බලපත්‍රයක් අවලංගු වීමට තුන් මසකට පළමුව බලපත්‍රය අළුත් කිරීම සඳහා ඉල්ලුම් කළ යුතු වුවද, ආයතන 09 ක් 2018 මාර්තු 16 දින වන විටත් පරිසර බලපත්‍ර අළුත් කරවාගෙන නොතිබුණි.

(ආ) ආයතන 03 ක් පරිසර බලපත්‍ර ලබා නොගෙන කර්මාන්ත පවත්වාගෙන ගොස් තිබුණි.

(ඇ) පරිසර ආරක්ෂණ බලපත්‍රය අළුත් කිරීමේදී සභාව විසින් දී ඇති උපදෙස් පිළිපැද තිබේද යන්න පිළිබඳව පසු විපරම් කර නොතිබුණි.

2.3.5 <u>වෙනත් ආදායම්</u>

<u>දුරකථන කුළුණු</u>

සභා බල ප්‍රදේශය තුළ පවතින දුරකථන කුළුණු සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකොට 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය පදනම් කර ගනිමින් අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ආදායම් වැඩි කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ කුළුණු දෙකකින් පමණක් වරිපනම් බදු අය කර තිබුණි.

2.3.6 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.මිලියන 07 ක් හා මුද්දර ගාස්තු රු.මිලියන 40 ක් විය.

03. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණ කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 18 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 15 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් 18 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) <u>කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්</u>

ඇස්තමේන්තු කළ පිරිවැය රු.1,809,465 ක් වූ කැරගල නව ආයුර්වේද ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දින වනවිට රු.706,815 ක් වැයකර ඇස්තමේන්තුවෙන් සියයට 40 ක ප්‍රමාණයක් පමණක් නිමකර තිබුණි.

(ඈ) <u>අත්හැරදැමූ කාර්යයන්</u>

සමාලෝචිත වර්ෂයේ කි. මී. 1000 ක් සංවර්ධනය කිරීමේ ප්‍රාග්ධන වැඩසටහන යටතේ ලැබී තිබුණු ව්‍යාපෘති 11 ක් අත්හැරදමා තිබුණි.

(ඉ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

සභා බල ප්‍රදේශය තුල කසළ කළමනාකරණය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 18,312,036 ක් වැය කර තිබුණි. නිරීක්ෂණ පහත දැක්වේ.

(i) 2008 ජූලි 30 දිනැති අංක 1560/06 දරන ගැසට්පත්‍රයේ 18(1) පරිදි වාර්ෂික කසළ එකතු කිරීමේ වියදම් පියවා ගැනීම සඳහා අයවැය ලේඛනයේ ගාස්තු නියමකර නොතිබුණි.

(ii) සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳ අධීක්ෂණ කමිටු 2018 මාර්තු 16 දින වන විටත් පිහිටුවාගෙන නොතිබුණි.

(ඊ) **පාරිසරික ගැටළු**
පාරිසරික ගැටළු පිළිබඳව සමාලෝචිත වර්ෂයේදී සභාවට මහජන පැමිණිලි 148 ක් ලැබී තිබූ අතර මහජන පැමිණිලි ලේඛනයේ පැමිණිල්ල ලැබූ දින සිට එහි අවසානය දක්වා ගත් ක්‍රියාමාර්ග නොදක්වා අදාල පැමිණිල්ල යොමු කළේ කාටද යන්න පමණක් සඳහන් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී මහජන පැමිණිලි 50 කට පමණ විසඳුම් ලබාදී නොතිබුණි.

(උ) **තිරසර සංවර්ධන ඉලක්ක**
තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ප්‍රාදේශීය සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 ජුනි 22 දින වන විටත් සකස් කර නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය
සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත පරිදි විය.

| ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 04 | 04 | - | - |
| තෘතීයික | 01 | 01 | - | - |
| ද්විතීයික | 60 | 53 | 07 | 01 |
| ප්‍රාථමික | 134 | 124 | 10 | - |
| | 199 | 182 | 17 | 01 |

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ පුස්තකාලයාධිපති තනතුරු 06 ක් වර්ෂ 15 ක පමණ සිට පුරප්පාඩුව පැවතුණි.

(ආ) 2014 දෙසැම්බර් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 පරිදි ප්‍රාථමික ගණයේ සෞඛ්‍ය කම්කරු 07 ක්, ක්ෂේත්‍ර කම්කරු 06 ක් , මුරකරු 04 ක්, හා පෙර පාසල් ගුරු 01 ක් ලෙස 18 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබා දී තිබුණ ද උක්ත චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාර කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කරගෙන නොතිබුණි.

(ඇ) 1975 අංක 1 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත හා 1988 අංක 74 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශකිරීමේ ( සංශෝධන ) පනත ප්‍රකාරව සභාවේ මාණ්ඩලික නිලධාරීන් විසින් වාර්ෂිකව ඉදිරිපත් කළ යුතු වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) සේවකයින් 10 දෙනෙකු විසින් වර්ෂය තුල වැටුප් රහිත නිවාඩු දින 264 ක් ලබාගෙන තිබුණු අතර එම නිවාඩු ලබාගැනීමට අදාල හේතු සොයා බලා නිවාඩු අවම කර ගැනීමට කළමනාකරණය විසින් පියවර ගෙන නොතිබුණි.

(ඉ) ක්ෂේත්‍ර නිලධාරීන් 06 දෙනෙකු සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරි වැඩසටහන් 2018 මාර්තු 16 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) නිලධාරිනියකගෙන් ලැබිය යුතු රු.88,750 ක සේවක ණය ශේෂයක් 2016 වර්ෂයේ සැප්තැම්බර් 15 දින සිට අය නොවී පැවතුණි.

3.3 **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

(අ) නව වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ අංක 20 හා 21 කඩ කාමර දෙකත්, පළමු මහලෙහි අංක 20, 21, 22 හා 24 යන කඩකාමර හතරත් කුලියට ලබාදී නොතිබූ අතර බිම් මහලේ කඩ කාමර දෙකෙහි තක්සේරු වටිනාකම මත 2013 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් දක්වා කාලයට අදාලව අහිමි වූ ආදායම රු.198,000 ක් විය. පළමු මහලෙහි කඩකාමර හතර තක්සේරු කර නොතිබුණි.

(ආ) වැකේ උප කාර්යාලයට අයත් අංක 02, 04 හා 05 දරන මාළු කඩ 2013 වර්ෂයේ සිටම බදු පදනම මත හෝ කුලී පදනම මත ලබා නොදීම නිසා 2017 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව අහිමි වූ ආදායම රු. 5,567,679 ක් විය.

(ඇ) නිවාස සැලසුම් අනුකූලතා සහතික නිකුත් කිරීම දුර්වල මට්ටමක තිබුණි.

3.4 **<u>වත්කම් කළමනාකරණය</u>**

3.4.1 **<u>ස්ථාවර වත්කම් ලේඛනගත නොකිරීම</u>**

පවත්වාගෙන යන ස්ථාවර වත්කම් ලේඛනවල වාර්ෂික මිලදී ගැනීම් , පරිත්‍යාග ලැබීම්, නව ප්‍රාග්ධනිත කිරීම් ඇතුළත් කර යාවත්කාලීන කර නොතිබුණි.

3.4.2 **<u>වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණය</u>**

(අ) ගිණුමේ දක්වා ඇති පහත සඳහන් වත්කම් වාර්ෂික සමීක්ෂණ වාර්තා වලට ඇතුලත්කර නොතිබුණි.

| | උපකාර්යාලය | වත්කම් ගණන | වටිනාකම<br>රු. |
|---|---|---|---|
| (i) | වැකේ | 03 | 109,352,354 |
| (ii) | පූගොඩ | 02 | 73,337,508 |
| (iii) | දොම්පේ | 09 | 12,518,707 |

(ආ) භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව දොම්පෙ උප කාර්යාලයේ දම්රෝ ප්ලාස්ටික් පුටු 78 ක ඌනතාවක් පැවතුණි.

3.4.3 **<u>නිෂ්ක්‍රිය/ඌන උපයෝජිත වත්කම්</u>**

පළාත් පාලන අමාත්‍යාංශය මගින් සභාවේ ඉල්ලීමකින් තොරව ලබා දී තිබූ ගැල්වනයිස් බට 423 ක් පැරණි ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ ඌන උපයෝජිතව පැවතුණි.

3.5 **හඳුනාගත් පාඩු**

(අ) 2016 වර්ෂයේ සිට මාළු වෙළඳසැල් හතරක් සඳහා සභාව විසින් ජලය හා විදුලිය වෙනුවෙන් ස්ථාවර ගාස්තු ගෙවමින් තිබූ නමුත්, එම මාළු වෙළඳසැල මාළු අලෙවිය සඳහා බදුදීමට හෝ වෙනත් ඵලදායී කටයුත්තක යෙදවීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව පසුගිය වසර දෙක සඳහා ස්ථාවර ගාස්තු ලෙස ජලය සඳහා රු.33,202 ක මුදලක් හා විදුලිය සඳහා රු.22,040 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) සියනෑ සෞන්දර්යය ආයතනය 2016 වර්ෂය ආරම්භයේ කිසිදු කටයුත්තකට යොදා නොගෙන ජල බිල් හා විදුලි බිල් ස්ථාවර ගාස්තු ගෙවමින් පවත්වාගෙන ගොස් තිබූ අතර ජල බිල් වෙනුවෙන් වසර දෙක සඳහා රු.6,955 ක් හා විදුලි බිල සඳහා රු.4,983 ක් ගෙවා තිබුණි.

3.6 **ප්‍රසම්පාදනය**

**ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා වාර්ෂික විස්තරාත්මක සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

04. **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**අයවැය පාලනය**

2017 වර්ෂයට අයවැය ගත ප්‍රතිපාදන රු.16,280,000 ක් අපේක්ෂිත කාර්යයන් සිදු කර නොතිබීම හෝ අවශ්‍ය නොවීම නිසා මුළු ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි.

05. **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | (i) | වරිපනම් හා කඩකුලී තක්සේරු නොකිරීම |
| | | (ii) | වරිපනම් බදු ප්‍රතිශත සංශෝධනය නොකිරීම |
| (ආ) | අයවැය පාලනය | (i) | ප්‍රායෝගික තත්ත්වයන්ට අනුකූල වන පරිදි අයවැය සකස් නොකිරීම |
| | | (ii) | විධිමත් පරිදි වැය විෂයයන් අතර මුදල් මාරු නොකිරීම |
| (ඇ) | වත්කම් කළමනාකරණය | (i) | වත්කම් මිලදී ගැනීමේදී හා නිකුත්කිරීමේදී ලේඛනගත නොකිරීම |
| | | (ii) | භෞතිකව නොමැති වත්කම් ගිණුම්වලින් ඉවත් නොකිරීම |

| | | | |
|---|---|---|---|
| | | (iii) | වත්කම් අයිතිය තහවුරු කිරිමට ඔප්පු හෝ පැවරුම් නියෝග ලබා නොගැනීම |
| | | (iv) | ඉන්වෙන්ටරි ලේඛන පවත්වා ගෙන නොයාම |
| (ඇ) | සන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) | කසළබදු හෝ ගාස්තු අය නොකිරීම |
| | | (ii) | කසළ වෙන්කර ලබා නොගැනීම |
| | | (iii) | කසළ බැහැර කිරීම සදහා යන වියදම් අවම කර නොගැනීම |